**ශීර්ෂය - 204 - හින්දු ආගමික හා සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව**

---

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මතය

හින්දු ආගමික හා සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුවේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව හින්දු ආගමික හා සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2022 මැයි 05 දින ගණන්දීමේ නිලධාරි වෙත නිකුත් කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව ගණන්දීමේ නිලධාරී වෙත වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2022 මැයි 27 දින නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මූල්‍ය ප්‍රකාශනවලින් 2021 දෙසැම්බර් 31 දිනට හින්දු ආගමික හා සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකිම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරිම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

------------------------------------------------------------

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

1.5 **වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව**

-------------------------------------------------

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

**2. මූල්‍ය සමාලෝචනය**

---------------------------

**2.1 වියදම් කළමනාකරණය**

-------------------------

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේදී දෙපාර්තමේන්තුව විසින් පුනරාවර්තන වැය විෂයයන් 05 ක් සඳහා සපයා ගෙන තිබුණු රු. 25,950,000 ක ප්‍රතිපාදනයෙන් සියයට 10 සිට සියයට 63 දක්වා වූ පරාසයක, එකතුව රු. 3,423,271 ක් වූ ප්‍රතිපාදන වියදම් නොකර ඉතිරි කර තිබුණි. | කොවිඩ් 19 වසංගත තත්ත්වය හේතුවෙන් අවශ්‍යතා ඇති නොවීම. | සපයාගත් ප්‍රතිපාදන අදාල වැය විෂයයන් සඳහා වැය කළ යුතු බව. |

2.2 **නීති,රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම**

-------------------------------------------

නියැදි විගණන පරීක්ෂාවේදී නිරීක්ෂණය වූ නීති,රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| | නීති,රීති හා රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 757 (2) සහ 2016 මාර්තු 31 දිනැති අංක | 2021 වර්ෂයට අදාල භාණ්ඩ සමීක්ෂණය මෙම වාර්තාවේ දින වනවිටත් පවත්වා නොතිබුණු අතර 2021 ජුනි 15 දිනට පෙර ඉදිරිපත් කළ යුතු 2020 වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණ වාර්තාව මාස 07 | කොවිඩ් 19 වසංගත තත්ත්වය හේතුවෙන් 2020 සමීක්ෂණ මණ්ඩල වාර්තාව ඉදිරිපත් කිරීම ප්‍රමාද විය. 2021 සමීක්ෂණය සිදු කරමින් පවතින අතර වාර්තා හැකි ඉක්මනින් ඉදිරිපත් කරනු ලැබේ. | මුදල් රෙගුලාසි හා චක්‍රලේඛය ප්‍රකාරව භාණ්ඩ සමීක්ෂණ වාර්තා ඉදිරිපත් කළ යුතු බව. |

| | | | | |
|---|---|---|---|---|
| | 05/2016 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය | කුත් දින 21 ක් ප්‍රමාද වී විගණකාධිපති වෙත ඉදිරිපත් කර තිබුණි. | | |
| (ආ) | 2001 අගෝස්තු 22 දිනැති අංක 18/2001 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය | වර්ෂ 5 ක් එකම සේවා ස්ථානයෙහි සේවා කර ඇති සෑම නිලධාරියෙකුටම වෙනත් සේවා ස්ථානවල සේවය කිරීමට ඉඩදීම සඳහා ස්ථාන මාරු ලබා දිය යුතු වුවත්, වර්ෂ 05 සිට වර්ෂ 10 දක්වා, වර්ෂ 11 සිට වර්ෂ 20 දක්වා සහ වර්ෂ 32 ක් සම්පූර්ණ කරන ලද පිළිවෙලින් 77 ක්, 15 ක් සහ 2 ක් වශයෙන් කාර්ය මණ්ඩලයේ නිලධාරීන් 94 දෙනෙකු සඳහා ස්ථාන මාරුවීම් ලබා දීමට කටයුතු කර නොතිබුණි. | රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයේ ඒකාබද්ධ සේවා අංශයේ පිහිටුවා ඇති ස්ථාන මාරු කමිටු වෙත අදාළ ලියකියවිලි ඉදිරිපත් කිරීමට වාර්ෂිකව කටයුතු කර ඇත. | චක්‍රලේඛ ප්‍රකාරව නිලධාරීන් සඳහා ස්ථාන මාරු ලබා දිය යුතු බව. |

## 2.3 අත්තිකාරම් නිකුත් කිරීම හා පියවීම

-----------------------------------------------

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| වෙනත් දෙපාර්තමේන්තු හා අමාත්‍යාංශ වෙත ස්ථාන මාරු වී ගිය නිලධාරීන් තිදෙනෙකුගෙන් අය විය යුතු එකතුව රු.46,462 ක් වූ ණය ශේෂය අවුරුදු 27 කට අධික කාලයක සිට පැවතියද අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි. | 2020/08/28 දිනැති අංක 01/2020 දරන රාජ්‍ය මූල්‍ය චක්‍රලේඛය සහ මුදල් රෙගුලාසි 113 ප්‍රකාරව රාජ්‍ය නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුමේ රු.25,000 ට අඩු හිඟ ශේෂයන් කපා හැරීම සඳහා අමාත්‍යාංශය වෙත යොමු කෙරේ. | හිඟ ණය ශේෂ අයකර ගත යුතු බව. |

**3. මෙහෙයුම් සමාලෝචනය**

-------------------------------

**3.1 වත්කම් කළමනාකරණය**

---------------------------

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | දෙපාර්තමේන්තුව විසින් ඉදිකර තිබූ යාපනයේ පිහිටි නාවලර් සංස්කෘතික මධ්‍යස්ථානය දෙපාර්තමේන්තුවට අවශ්‍ය අවස්ථාවක ආපසු ලබා ගැනීමේ කොන්දේසිය මත 1985 වර්ෂයේදී යාපනය මහ නගර සභාවට බාර දී තිබුණි.<br>ඒ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කෙරේ. | | |
| (i) | මහල් දෙකකින් යුක්ත මෙම ගොඩනැඟිල්ලේ එක් මහලක් යාපනය මහ නගර සභාව විසින් භාවිතා කරමින් පැවති අතර නිසි පරිදි නඩත්තු නොකිරීම හේතුවෙන් ගොඩනැඟිල්ලේ වහල , බිත්ති සහ ඇතැම් දොරවල් දිරාපත් වෙමින් පවතින බවත් අදාල අළුත්වැඩියාවන් සිදු කිරීමට කටයුතු කළ යුතු බවත් භෞතික පරීක්ෂාවේදී නිරීක්ෂණය විය. | නාවලර් සංස්කෘතික මධ්‍යස්ථානය යාපනය මහ නගර සභාවෙන් පවරා ගැනීමට කටයුතු කරනු ලැබේ. | අදාල අළුත්වැඩියාවන් සිදු කිරීමට කටයුතු කළ යුතු බව. |
| (ii) | ගොඩනැඟිල්ලෙහි එක් මහලක් නිශ්කාර්යව පැවතියදී දෙපාර්තමේන්තුවේ උතුරු පළාත් ප්‍රාදේශීය කාර්යාලය රු. 40,000 ක මාසික කුලියකට වෙනත් ගොඩනැගිල්ලක පවත්වා ගෙන යමින් පැවතුණි. | පිළිතුරු සපයා නොතිබුණි | දෙපාර්තමේන්තුවට අයිත් ගොඩනැඟිල්ලක් නිශ්කාර්යව පැවතියදී කුලී පදනම මත කාර්යාලය පවත්වා නොගත යුතු බව. |
| (ආ) | 2002 වර්ෂයේදි මිලදි ගෙන තිබු ත්‍රීරෝද රථයක් 2015 වර්ෂයේ සිට ධාවනයෙන් තොරව පැවතුණද අළුත්වැඩියා කිරීමට හෝ අපහරණය කිරීමට කටයුතු කර නොතිබුණි. | අපහරණය කිරීමට කටයුතු කරනු ඇත. | ධාවනය කළ නොහැකි හා අළුත්වැඩියා කළ නොහැකි වාහන අපහරණය කළ යුතුය. |

### 3.2 වාර්ෂික කාර්යසාධන වාර්තාව

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2002 සැප්තැම්බර් 12 දිනැති අංක 402 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව මුදල් වර්ෂය අවසාන වී දින 150 ක් ඇතුළත වර්ෂයට අදාල කාර්යසාධන වාර්තාව පාර්ලිමේන්තුවේ සභාගත කළ යුතු වුවත්, දෙපාර්තමේන්තුව විසින් 2020 වර්ෂයට අදාල කාර්යසාධන වාර්තාව මෙම වාර්තාවේ දින වන විටත් පාර්ලිමේන්තුවේ සභාගත කර නොතිබුණි. | වාර්ෂික කාර්යසාධන වාර්තාව හැකි ඉක්මනින් ඉදිරිපත් කරනු ලැබේ. | අදාල කාලසීමාවන් තුළ කාර්යසාධන වාර්තාව ඉදිරිපත් කළ යුතු බව. |

### 3.3 කළමණාකරන දූර්වලතා

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| දෙපාර්තමේන්තුව විසින් පරිහරණය කරනු ලබන නාවලර් සංස්කෘතික මධ්‍යස්ථානය සහ කුරුකුලම් ආනපන්දි උපකාර්යාලය පිහිටා ඇති ගොඩනැඟිලි ද ඊට අදාල භූමිය ද දෙපාර්තමේන්තුව වෙත ලබා ගැනීම සඳහා විධිමත් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | නාවලර් සංස්කෘතික මධ්‍යස්ථානය යාපනය මහ නගර සභාවෙන් පවරා ගැනීමට කටයුතු කරනු ලැබේ. | අදාල වත්කම් නැවත පවරා ගැනීමට කටයුතු කළ යුතු බව. |

## 4 මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| දෙපාර්තමේන්තුවේ අනුමත තනතුරු සංඛ්‍යාව 185 ක් වුවද සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට තත්‍ය කාර්ය මණ්ඩලය 149 ක් වූයෙන් කාර්ය මණ්ඩලයේ 36 ක පුරප්පාඩු පැවතිණි. ඒ අතුරින් නියෝජ්‍ය/ සහකාර අධ්‍යක්ෂ තනතුරු 03 ක්, සංවර්ධන නිලධාරි තනතුරු 19 ක්, කළමනාකරණ සහකාර තනතුරු 06 ක් සහ පරිපාලන නිලධාරී තනතුර පුරප්පාඩු වී පැවතීම දෙපාර්තමේන්තුවේ කාර්යසාධනය කෙරෙහි බලපෑමක් ඇති කිරීමට හේතු වී ඇති බව නිරීක්ෂණය කෙරේ. | එකඟ වේ. පුරප්පාඩු පිරවීම සඳහා රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය වෙත ඉල්ලීම් කිහිපයක් ඉදිරිපත් කර ඇත. තනතුරු පිරවීමේ ප්‍රමාදය අපට පාලනය කළ නොහැකි වේ. | පුරප්පාඩු පිරවීමට කඩිනමින් කටයුතු කළ යුතු බව. |